පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සතිය -

විෂය - චිත්‍ර විෂය

ශ්‍රේණිය - 6

සැකසුම - උපුලී චතුරානි ධර්මසේන


මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 7.1.3 මුස්ලිම් පල්ලියක (මස්ජිදය) මූලිකාංග හා එහි කලා නිර්මාණ




කොම්පඤ්ඤවීදියේ මුස්ලිම් පල්ලිය

ඉස්ලාම් පල්ලිය  මස්ජිදය




A - අඩ සඳ හා තරුව
B - ශිඛරය /කුඟා/ කුම්බා (Dome)
C - මිනාර්/මිනරෙට්

විවිධ හැඩ මතුවන ලෙස ලියන ලද අරාබි අක්ෂර



- අරාබියේ සිට ලංකාවට මුස්ලිම්වරු පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස මුස්ලිම් මස්ජිද ලංකාවේ ඇති විය.

**<u>මස්ජිදයක සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණය</u>**

- උල් වූ තුඩක් සහිත ගෝලාකාර විශාල ශිඛරයකි. එය කූඹා ලෙසද හඳුන්වයි.
- පල්ලිය ඉදිරිපිට ඇති පොකුණ හා දොරටුව මැදි කර තනා ඇති තොරණ විශේෂ නිර්මාණාංග වේ.
- මුස්ලිම් පල්ලියේ දෙපස මිනාර් හෙවත් මිනරෙට් නමින් හඳුන්වන කුලුණු දෙකකි.මේ කුලුණු මුදුන්වල ද ගෝලාකාර ශිඛර දැක ගත හැකිය.
- සෑම කුලුණකම මුදුනේ අඩ සඳ හා තාරකා සංකේත මූර්තිමත් කර ඇත.
- මුස්ලිම් අල්ලි වල චිත්‍ර හා ප්‍රතිමා නිර්මාණ කිසිවක් දක්නට නොලැබේ.
- ඉස්ලාම් ආගමික ග්‍රන්ථය වන කුරාණය කුරාණයේ ඇති පාඨ අරාබි බසින් පල්ලියේ බිත්ති මත සටහන් කර ඇත. මෙම පාඨ විවිධ හැඩ මතු වන සේ කලාත්මකව නිර්මාණය කර ඇත. රූපාක්ෂර හෙවත් කැලිග්‍රැෆි (calligraphy) නමින් මේවා හඳුන්වයි.

**ඇගයීම**

1. මස්ජිදයක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

2. ඉස්ලාම් පල්ලියක දැකිය හැකි කලාත්මක නිර්මාණ අංග නම් කරන්න.

   ……………………………………………………………………………………….

   …………………………………………………………………………………………….

3. සෑම කණුවකම මුදුණේ දක්නට ලැබෙන සංකේතය කුමක්ද?
4. මුස්ලිම් පල්ලියේ බිත්ති වල ඇඳ ඇති විචිත්‍ර අක්ෂර ලිවීමේ කලාව කුමන නමකින් හඳුන්වයිද?..............................

5. ඉස්ලාම් ආගමික ග්‍රන්ථය කුමක්ද?...........................................